(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 84]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2009 මැයි මස 05 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0080/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 1994 අප්‍රේල් මස විසි පස් වැනි දින සිට මේ දක්වා—

(i) ඒක පුද්ගල ණය;

(ii) ගෙවිය යුතු පොළිය සමඟ මුළු ණය;

(iii) ඇමෙරිකානු ඩොලරයේ වටිනාකමට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය;

(iv) ආයාත අනුපාතයට සාපේක්ෂව සංචිත;

(v) දරිද්‍රතා මට්ටම;

(vi) මසකට රුපියල් 1,000/- ට අඩුවෙන් ආදායම් ලබන පවුල් සංඛ්‍යාව;

(vii) ගෙවුම් ශේෂය;

(viii) සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) - (viii) අනුව, රට ප්‍රගතියක් ලබා තිබේද නැතිනම් වර්ධනය හීන වී තිබේද යන්න සාක්ෂි සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0347/'08

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2004 වර්ෂයේ නව රජය බලයට පත්වීමෙන් පසු අදාළ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් මේ දක්වා විදේශ සංචාරය කළ රටවල් කවරේද;

(ii) එතුමා විසින් කරන ලද නිල හා පෞද්ගලික විදේශ සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාර සඳහා එතුමා සමඟ සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගී වූයේ නම් ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එතුමා ඇතුලු අනෙකුත් නිලධාරීන් විදේශගත වූ ගුවන් සමාගම හා ගුවන් පන්තිය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම විදේශ සංචාර වලින් මෙරටට ලැබුණු විදේශ ආධාර, විදේශ ණය, ව්‍යාපෘති හෝ වෙනත් ප්‍රතිලාභයන් කවරේද යන්න එක් එක් සංචාරයට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0750/'08

3.
ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාදුක්ක, මීපේ, හේවාගම්වත්ත, දියවර ගම්මාන ව්‍යාපෘතියක් සඳහා ඉඩම් බෙදා දීම සඳහා 90 දෙනෙක් තෝරාගෙන ඇති බවත්;

(ii) පාදුක්ක ප්‍රාදේශීය ලේකම් විසින් 2003.08.22 වැනි දින ඉඩම්ලාභීන්ගේ රැස්වීමක් කැඳවූ බවත්;

(iii) නැවත 2005.06.18 වැනි දින ආයතනවල නිලධාරීන් සහ මහජන නියෝජිතයින්ගේ ප්‍රධානත්වයෙන් පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ඉඩම්ලාභීන්ගේ රැස්වීමක් කැඳවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රදාන පත්‍රයක් ලෙස, රාජ්‍ය මුද්‍රාව සහිතව, "නිවාස අරමුණ වෙනුවෙන් ඉඩම් කොටසක් පවරාදීම" යනුවෙන් සඳහන්, කැබලි අංකය හෝ ඉඩම් ප්‍රමාණය සඳහන් නොකළ හිමිකම් පත්‍රයක් ඉඩම්ලාභීන්ට ලබාදී ඇති බවත්;

(ii) 2005.10.20 වැනි දින පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති දියවර ගම්මානයේ ආරම්භක උත්සවයේදී නිවසක් සාදා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් රු.50,000/= ක් ලබාදෙන බවට ඉඩම්ලාභීන්ට ලිපියක් ප්‍රදානය කළ බවත්;

(iii) කට්ටිලාභීන් තෝරා ගැනීමට අයදුම්පත් භාරගෙන ඇත්තේ 2000 වර්ෂයේ වන අතර 2001.08.09 දින ඉඩම් කච්චේරිය පාදුක්ක ප්‍රජාශාලාවේදී පැවති බවත්;

(iv) තෝරාගත් කට්ටිලාභීන්ගෙන් එක් අයෙකුගෙන් මැනීමේ ගාස්තු ලෙස රු.1,500/= ක් ද ඉඩම් ප්‍රතිසංස්කරණ සභා අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු.100/- ක්ද, ඉඩම් එළිපෙහෙළි කිරිමට වරින්වර රු.10,000/= ක්ද අයකර ගෙන ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත අයට මෙතෙක් ඉඩම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'08

4.
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුර, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උතුරු මැද හා සබරගමුව, පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුර සහ දිස්ත්‍රික්කය ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ අනුව නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණවලදී ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් සහ ශාලා අංක අනුව ගණන් කිරීමේ ප්‍රධාන නිලධාරී ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ නාම ලේඛනය, ලිපිනයන් සහ සේවා ස්ථානයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණ දිනයන්හිදී ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරීන්ගේ නම, තනතුර සහ ආයතනයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1006/'08

5\.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 27 අ(1) වගන්තියට අනුව, අංක 195/6 හා 1982.05.31 දිනැති ගැසට් පත්‍රය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගා/බද්දේගම, පිලගොඩ, වැලිවත්ත ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ තිබියදී, කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, අංක 811/1 හි බර්න්ස් ට්‍රේඩිං සමාගමේ 2002.03.16 දිනැති බදු ඉල්ලීම් ලිපියට, එවකට ඉඩම් අමාත්‍යවරයා විසින් 2002.05.16 දින අනුමතිය ලබාදුන්නේ කෙසේද;

(ii) 2003 පෙබරවාරි 26 දින අංක 260 දරන බදු ඔප්පුව මගින් ඉහත සමාගමට කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් සඳහා අවුරුදු 50 ක කාලයකට බදු දුන්නේ කවර නීත්‍යානුකූල තත්ත්වයක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත බදු ගිවිසුමේ 11 වැනි වගන්තියට අනුව අදාළ ව්‍යාපෘතිය මාස 06 ක කාලයක් තුළ ආරම්භ නොකිරීම හේතුවෙන් එම බදු ගිවිසුමද අවලංගු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඉහත බදු දුන් දින සිට මේ දක්වා ලබාදී ඇති බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් තමන්ට අයිති නොවන දේපලක් බදු දී ඇති බැවින් අදාළ බදු ගිවිසුම අවලංගු කර රාජ්‍ය වැවිලි සංස්ථාවට එම ඉඩම පැවරීම කවර කාල සීමාවක් තුළ සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන් ද ?

1056/'08

6\.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ලංකා බැංකුව මගින් 2005 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට මේ දක්වා —

(i) එක් පුද්ගලයෙකුට හෝ ආයතනයකට රුපියල් මිලියන 50 ට වඩා ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය ලබාදුන් ආයතන හා පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම ණය නිකුත් කිරීමට ප්‍රථම ඔවුන්/ එම ආයතන විසින් වෙනත් බැංකු වලින් හෝ ලංකා බැංකුවෙන් ණය ලබාගෙන ඒවා ගෙවීම පැහැරහැර තිබුණේද;

(iv) එසේනම් ගෙවීම පැහැරහැර ඇති එම ණය ලබාගන්නා ලද බැංකුව සහ මේවන විට ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 නොවැම්බර් මාසයෙන් පසුව රුපියල් මිලියන 50 ට වඩා ණය ලබාගත් අය / ආයතන විසින් තබා ඇති සුරැකුම් හා ඔවුන්ට/ආයතනවලට ලබාදුන් ණයවලට අදාළ පොලී අනුපාතිකය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1099/'08

7\.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ටින් මාලු සහ කරවලවලට අමතරව අමු මාලු විදේශ රටවලින් ආනයනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ ගෙන්වනු ලබන මාලු වර්ග කවරේද;

(ii) පසුගිය වසර 05 කාලය තුළ ආනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා බදු අයකිරීමක් සිදුකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාලු ආනයනය සිදු කරන ආයතනය හෝ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) එලෙස ආනයනය කරන ලද මාලු අලෙවි කිරීම සිදුකරන්නේ ලංකා ධීවර සංස්ථාවේ අලෙවිසැල් මගින්ද;

(iii) එසේනම් එම අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාලය තුළ එම අලෙවිසැල්වලට සපයන ලද මාලු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1134/'08

8\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සෑම විශේෂ මාර්ග ව්‍යාපෘතියක් සඳහාම පිහිටුවා ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ සහ ප්‍රතිස්ථානගත කිරීමේ අංශයන් හි ව්‍යුහය පිළිබඳ තොරතුරු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම සංවිධාන ව්‍යුහය තුළ සිටින සේවක සංඛ්‍යාව අනියම්, කොන්ත්‍රාත් සහ ස්ථිර ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම විශේෂ මාර්ග ව්‍යාපෘතිවල ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා පදනම් කරගනු ලබන්නේ රජයේ මැනුම්පතිවරයාගේ මූලික පිඹුරක්ද, අවසාන ගම් පිඹුරද, නොඑසේ නම් අනුරේඛනයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම විශේෂ මාර්ග ව්‍යාපෘති කටයුතුවලදී අදාළ අමාත්‍යාංශය විසින් අනුරේඛනයන් පදනම් කරගනිමින් ඉඩම් සඳහා වන්දි ගෙවනු ලැබූ අවස්ථා සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතුවලදී අනුරේඛනයන් පදනම් කරගනිමින් ඉඩම් සඳහා වන්දි ගෙවීම අදාළ අමාත්‍යතුමා අනුමත කරන්නේද;

(ii) අනුරේඛනයන් මගින් ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී භෞතිකව එකම ස්ථානයක පිහිටි එකම ඉඩමකට දෙවරක් වන්දි නොගෙවන බවට සහතිකයක් ලබාදීමට හැකිද;

(iii) එසේ ගෙවන ලද අවස්ථා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/’08

9.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2007 ඔක්තෝබර් මස 23 වැනි දින හෝ ඊට ආසන්න දිනක එච්.එස්.බී.සී. බැංකුවේ මැදිහත්වීම තුළින් ස්වෛරීත්ව ඇපකරයක් (Sovereign Guarantee) ලබා දී ඩොලර් මිලියන 500ක බැඳුම්කරයක් ලබා ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලබා ගත් මුලු මුදල කොපමණද;

(ii) ඉදිරිපත් කරන ලද පොලී අනුපාතිකය, එකඟවන ලද කොන්දේසි හා ඇපය අවසන් වන දිනය කවරේද;

(iii) මෙම ඇමෙරිකන් ඩොලර් මිලියන 500 ලබා ගැනීම සඳහා වූ වියදම කොපමණද;

(iv) එය ස්ථාවර හෝ නම්‍ය අනුපාතිකයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාස 60 කට මුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා රාජ්‍ය ණය අරමුදලක් ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, මාසිකව වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අද වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේ ලන්ඩන් ඉන්ටර් බැන්ක් (LIBOR) හි අනුපාතය හා ෆෙඩරල් රිසර්ව්ස් (FEDEX) හි අනුපාතය කවරේද;

(iv) ණය මුදල ලබාදුන් අවස්ථාවේ දී ඉහත අනුපාතයන් කවරේද;

(v) මුදල් වියදම් කළේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0895/’08

10.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහභාරකාරතුමා යටතේ පැවති තුම්බෝවිල, වැවල, සයිමන්ඩේල් වත්ත ලෙස හඳුන්වන ලද ඉඩමේ සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එකී භූමි ප්‍රමාණයෙන් කවර හෝ කටයුත්තකට කවර හෝ ක්‍රමයකට කවරෙකුට හෝ ලබා දී ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එය ලබා දී ඇත්තේ කවරෙකුටද, කවර කටයුත්තක් සඳහාද, කවර පදනමකින්ද;

(iv) එය ලබාදී ඇති දිනය සහ ඒ කොපමණ කාල සීමාවක් සඳහාද;

(v) එසේ ලබාදීමෙන් අනතුරුව දැනට ඉතිරිව ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මහාභාරකාරතුමා යටතේ ඇති මෙම රජයේ ඉඩම් කවර හෝ පාර්ශ්වයකට විකිණීමේ හැකියාව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/'08

11.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ ප්‍රවාහන ගිණුම් නිලධාරී තනතුරට පත්කරනු ලැබ ඇත්තේ කවුරුන්ද;

(ii) ඔහුගේ සම්පූර්ණ නම හා පෞද්ගලික ලිපිනය කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එම තනතුරට බඳවාගෙන ඇත්තේ කවර පදනමකින්ද;

(v) ඔහුගේ මූලික වැටුප, සියලු දීමනා සහිතව ලබන වැටුප, ලබන වෙනත් වරප්‍රසාද හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1135/'08

12.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශේෂ මාර්ග ව්‍යාපෘතිවල ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සිදුකිරීමේදී, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ, 5 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යතුමාගේ තීරණය ගැසට් මඟින් ප්‍රකාශයට පත්වීමට ප්‍රථම සහ 38(අ) අතුරු විධානය, ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට ප්‍රථම වන්දි ගෙවන ලද ඉඩම් සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාර තීරණය හෝ 38(අ) අතුරු විධානය හෝ ගැසට් මඟින් ප්‍රකාශයට පත්වීමට ප්‍රථම අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවන ලද්දේ කවර ප්‍රතිපාදන යටතේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ආකාරයේ ගෙවීම් සඳහා රජයෙන් ලබාගත් මුදල කොපමණද;

(ii) එම ගෙවීම් සිදුකිරීමට අදාළ අමාත්‍යතුමාට සැලසී ඇති නෛතික ප්‍රතිපාදන කවරේද;

(iii) ගෙවීම් නීත්‍යානුකූල හා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතට සෑම ආකාරයකින්ම අදාළ වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද ?

(ඈ) ඉහත පනතේ 5 වැනි වගන්තිය හා පනතේ 38(අ) අතුරු විධානයද ගැසට් මඟින් ප්‍රකාශයට පත් නොකොට ඉඩම්වල නිරවුල් භුක්තිය බාර නොගෙන, අදාළ බිම් කොටස්වල පුරවැසියන් ඉවත්කොට මහාමාර්ගයක් ඉදිකිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් විධායකය සහ ව්‍යවස්ථාදායකය අභියෝගයට ලක්කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) ඉහත කරුණ සම්බන්ධව පැහැදිලි කිරීමක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'08

13.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය 2002.12.31 වැනි දින ඈවර කරන ලද බවට 2004.02.31 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති බවත්;

(ii) සේවකයිනට ලබා දුන් වරප්‍රසාද අනුව වන්දි ලබාගෙන සේවයෙන් ඉවත්වීමටත්, රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමටත් අවස්ථාව ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් නොවූ විවිධ තනතුරු කාණ්ඩවලට අයත් සේවකයින් කොපමණ සංඛ්‍යාවක් දැනට සේවයේ යෙදී සිටින්නේද;

(ii) ඒ ඒ තනතුරු කාණ්ඩවලට අදාළව සුදුසු රාජකාරි වගකීම් පවරා දී තිබේද;

(iii) එම තනතුරු කාණ්ඩ අතුරින්, සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ සහ ඵලදාවර්ධන නිලධාරි තනතුර දරන විධායක නිලධාරීන් සඳහා ඔවුන් ලබා ඇති සේවා කුසලතා මත රාජකාරීන් පවරා තිබේද;

(iv) ඵලදායී සේවාවක් එම නිලධාරීන්ගෙන් රජයට ලබා ගන්නේ නම් ඒ කවරේද;

(v) ඉහත (ආ) (iii) නිලධාරීන් අදාළ අමාත්‍යාංශයට අනුයුක්තකර දැනට කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0082/'08

14.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විට එක් රාජ්‍ය ආයතනයක් විසින් තවත් රාජ්‍ය ආයතනයක් වෙත ගෙවීමට තිබූ මුළු මුදල කොපමණද;

(ii) ගෙවීමට ඇති මුදල් ආයතනයේ පැවැත්මට විශාල ගැටළුවක් වී ඇති ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා කොළඹ මහ නගර සභාව වැනි ආයතන කවරේද;

(iii) ඉහත සඳහන් ආයතනවලට අදාළව පසුගිය වසර 5ක කාලය සඳහා විස්තරාත්මක විශ්ලේෂණයක් කවර ආකාරයක් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම්දෙන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, කොළඹ මහ නගර සභාව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මිහින් එයාර් සමාගම, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා පොහොර සංස්ථාව යන ආයතනවල හිඟ මුදල් තිබීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒවා ගෙවනු ලබන දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1136/'08

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂ මාර්ග ව්‍යාපෘතිවල ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් අනතුරුව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක් සිදු කරන්නේද;

(ii) අදාළ පැවරුම් පත්‍රයන් නිසිපරිදි ලබාගෙන තිබේද;

(iii) වන්දි ගෙවන ලද නමුත් අදාළ පනතේ 44 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි නොකර, පැවරුම් පත්‍රයන්ද ලබා නැති කැබලි තොරතුරු කවරේද;

(iv) අනුරේඛනයන් මගින් කරනු ලබන ගෙවීම් සඳහාද 44 වැනි වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් ලබා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරීන්ට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ඉඩම් අමාත්‍යතුමාගේ අනුමතිය අවශ්‍ය නොවීමට හේතු කවරේද;

(ii) ඉහත අයට පාර්ලිමේන්තු පනතක් අභිබවා කටයුතු කිරීමට ලබාදී ඇති බලතල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ,— ප්‍රාග්ධන වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් වශයෙන් සුරැකුම්කරණය සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද; සුරැකුම්කරණ ප්‍රවාහක නිර්මාණය කිරීම සඳහා සහ වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්පත්වල ආයෝජකයන් සම්බන්ධයෙන් වූ වගකීම් පහසුකරලීම සඳහා ද; සුරැකුම්කරණ කර්මාන්තයේ යෙදී සිටින උත්පාදකයන් සහ මූල්‍ය අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් ක්‍රමවත් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරක්ෂිතලත් ගනුදෙනු,— චංචල දේපළ සම්බන්ධයෙන් වගකීම් සුරක්ෂිත කිරීම, සුරක්ෂිතලත් ගනුදෙනු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම සහ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන),— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

5.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

6.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 මැයි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— මදුරුවන් බෝවීම වැලැක්වීමේ පනත යටතේ නියෝග ,— 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැලැක්වීමේ පනතේ 3, 5, 13 සහ 17 වැනි වගන්ති සමග කියවිය යුතු 23 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 අගෝස්තු 22 දිනැති අංක 1563/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.
ශ්‍රී ලංකා හු දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*5.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පස සංරක්ෂණ පනත යටතේ නියෝග,—(450 වැනි අධිකාරය වූ) පස සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පස සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.04.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පස සංරක්ෂණ පනත යටතේ නියමය,—(450 වැනි අධිකාරය) පස සංරක්ෂණ පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2008 මැයි මස 22 දිනැති අංක 1550/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*7.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— ශාක ආරක්ෂක පනත යටතේ නියෝග,— 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 12 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඉ) සහ (එ) ඡේද යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 පෙබරවාරි මස 10 දිනැති අංක 1588/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*9.

මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත —දෙවැනි වර කියවීම

*10.

වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*13.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*14.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*15.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*16.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*17.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*19.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*20.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04)[1]

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/-<br>රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007. 08. 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

27.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

28.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

29.
ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

30.
ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

31.
සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

32.
කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

33.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0824/'08

1.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගාල්ල, බලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සංඛ්‍යාව කොපමණද;
(ii) එක් එක් මාර්ගයේ නම සහ දුර ප්‍රමාණය කිලෝමීටර් කොපමණද;
(iii) 2006 වර්ෂයේදී අදාළ ප්‍රාදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස්කර තිබූ කිලෝමීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) අදාළ ප්‍රාදේශීය සභාව පත්වීමෙන් අනතුරුව කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස්කර තිබෙන මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(v) එම එක් එක් මාර්ගය සකස් කරන ලද්දේ කවර අරමුදලකින්ද;
(vi) ඉහත මාර්ග අතුරින් දැනට ප්‍රතිසංස්කරණය කරමින් තිබෙන හෝ සැලසුම්ගත පරිදි 2008 වර්ෂය අවසන් වන විට සකස් කිරීමට ඉතිරිවන මාර්ග සංඛ්‍යාව කොපමණද;
(vii) වත්මන් ප්‍රාදේශීය සභාවේ නිල කාලය අවසන් වනවිට ඉතිරි මාර්ග සියල්ල කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0829/'08

2\.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගාල්ල, හික්කඩුව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් මාර්ගයේ නම සහ දුර ප්‍රමාණය කිලෝමීටර් කොපමණද;

(iii) 2006 වර්ෂයේදී අදාළ ප්‍රාදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස්කර තිබූ කිලෝමීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අදාළ ප්‍රාදේශීය සභාව පත්වීමෙන් අනතුරුව කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස්කර තිබෙන මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම එක් එක් මාර්ගය සකස් කරන ලද්දේ කවර අරමුදලකින්ද;

(vi) ඉහත මාර්ග අතුරින් දැනට ප්‍රතිසංස්කරණය කරමින් තිබෙන හෝ සැලසුම්ගත පරිදි 2008 වර්ෂය අවසන් වන විට සකස් කිරීමට ඉතිරිවන මාර්ග සංඛ්‍යාව කොපමණද;

(vii) වත්මන් ප්‍රාදේශීය සභාවේ නිල කාලය අවසන් වනවිට ඉතිරි මාර්ග සියල්ල කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?